සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP)

(2020- 2024)

පාසල් පාදක ඉගෙනුම් බලගැන්වීමේ ප්‍රදානය

(SBLEG)

School Base Learning Enhancement Grant

# උපදෙස් හා මාර්ගෝපදේශ සංග්‍රහය

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

බදුල්ල

## 1.0 හැඳින්වීම

2018 – 2024 කාලය තුළ ලෝක බැංකු අනුග්‍රහය යටතේ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක වේ. සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා අධ්‍යාපනයේ භාරකාරත්වය බලගැන්වීම අරමුණු කර ගනිමින් උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මකවේ. ජාතික අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය,වෙනත් පළාත් අධ්‍යාපන ක්‍රියාවලීන් සඳහා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සඳහා මූල්‍යමය හා න්‍යායාත්මක සහාය ලබාදීම ව්‍යාපෘතියේ ප්‍රමුඛ කාර්ය භාරය වේ.

මෙම ව්‍යාපෘතිය තුළ ප්‍රධාන වශයෙන් පහත ක්ෂේත්‍ර වල ප්‍රතිඵල පාසල් පද්ධතිය තුළ වර්ධනය කිරීමට බලාපොරොත්තුවේ.

- ✓ ඉංග්‍රීසි භාෂා අධ්‍යාපන ඉගෙනුම් ඵල
- ✓ ගණිත අධ්‍යාපන ඉගෙනුම් ඵල
- ✓ පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන
- ✓ පාසල් නඟා සිටුවීම බලගැන්වීමේ වැඩසටහන

එමෙන්ම ප්‍රධාන වශයෙන් දර්ශක (DLI) 9ක් ඔස්සේ ප්‍රතිඵල ළඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ.

ව්‍යාපෘතිය තුළ ඉහත සඳහන් ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා සහාය ලැබෙන අතර, පාසල් පද්ධතියේ උක්ත අධ්‍යාපන සංවර්ධනය ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරවීම සඳහා සෘජුවම පාසල් වෙත අරමුදල් ලබා දීමට කටයුතු කරනු ලබයි. එම අරමුදල් අවසාන ගෙවීමක් ලෙස පාසල් පාදක ඉගෙනුම් බලගැන්වීමේ ප්‍රදාන (SBLEG) නමින් පාසල් සංවර්ධන සමිති ගිණුමට බැරකරනු ලබයි. එම මූල්‍ය ප්‍රදානයන් ඵලදායි ලෙස, කාර්යක්ෂම ව හා නිසි ක්‍රමවේදයන් අනුගමනය කරමින් උපයෝජනය කිරීම අපේක්ෂා කරන අතර ඒ සඳහා මඟපෙන්වීමක් ලෙස මෙම උපදෙස් හා මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත.

## 2.0 අරමුණු

පොදුවේ ජාතික හා පළාත් මට්ටමෙන් ලබා දෙන ප්‍රතිපාදන පාසල්වල වාර්ෂික සංවර්ධන සැලසුම් හා ඇස්තමේන්තු අනුව පවත්වා ගන්නා ව්‍යුහගත ක්‍රමවේද තුළ භාවිත කෙරේ. ඊට අමතරව, මෙම පාසල් පාදක ඉගෙනුම් බලගැන්වීමේ ප්‍රදානය පහත දැක්වෙන ප්‍රධාන අරමුණු ළඟාකරගැනීම ඉලක්ක කර ගනිමින් භාවිත කිරීම අපේක්ෂා කෙරේ.

1. ඉංග්‍රීසි භාෂා ඉගෙනුම් ඵල වර්ධනය කිරීම.
2. ගණිත විෂය ඉගෙනුම් ඵල වර්ධනය කිරීම.

3. පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් මගින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීම.
4. පාසල් නඟා සිටුවීම බලගැන්වීමේ වැඩසටහනේ අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම හා දරුවන්ගේ මනෝ සමාජීය කුසලතා ඉහළ නැංවීම.

**3.0 මුල්‍ය මූලාශ්‍රය**

පාසල් පාදක ඉගෙනුම් බලගැන්වීමේ ප්‍රදානයන් (SBLEG) සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් අවසන් ගෙවීමක් ලෙස (out right grant) ලබා දේ.

**4.0 මුල්‍ය උපයෝජන ක්ෂේත්‍ර.**

උක්ත 2.0 යටතේ දැක්වෙන අරමුණු සාක්ෂාත් කර ගැනීමට අදාළව පහත ක්ෂේත්‍ර සඳහා මෙම අරමුදල් භාවිත කළ හැකි වේ.

**<u>4.1 උපදේශන සේවා සහ උසස් අධ්‍යාපන ක්‍රියාවලීන්</u>**

- සිසුන් සඳහා පවත්වන සම්මන්ත්‍රණ / පෙරහුරු/ වැඩමුළු ආදිය
- සිසු නිර්මාණාත්මක ක්‍රියාකාරකම්.
- නිශ්චිත අරමුණු සඳහා වන ශිෂ්‍ය කඳවුරු හා ක්ෂේත්‍ර චාරිකා හා ක්‍රියාකාරකම්.
- පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන් / වැඩමුළු හා ගුරු නිර්මාණ.
- සුවදායි ඉගෙනුම් ඉගැන්වීම් වාතාවරණයක් ඇතිකිරීම.
- මනෝසමාජයීය කුසලතා වැඩිදියුණු වන පරිදි සිසු/ ගුරු/ දෙමව්පිය වැඩසටහන්

**4.2 <u>පාසල් කළමනාකරණ සංවර්ධනාත්මක ක්‍රියාකාරකම්</u>**

- පාසල් නගා සිටුවීම බලගැන්වීමේ වැඩසටහනට අදාළ පාසල් මට්ටමේ වැඩසටහන්

**5.0 ක්‍රියාත්මක ක්‍රමවේදය.**

5.1 අංක 2.0 හි දැක්වෙන අරමුණු ඉටුවන පරිදි වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට, ඇස්තමේන්තුවට මෙම අරමුදල් වලින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් ඇතුළත් ව තිබිය යුතුය.

5.2 මෙම පාසල් පාදක ඉගෙනුම් බලගැන්වීමේ ප්‍රදානය සඳහා, ඉහත ක්‍රියාකාරකම් ඇතුළත් කර සකසන ලද වෙන ම ව්‍යාපෘති යෝජනාවකින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබාගත යුතුය. (ආකෘතිය 1 )

1. සටහන :- 2021 වර්ෂයේ දී මීට අදාළව ප්‍රමාණවත් හා ගැළපෙන ක්‍රියාකාරකම් වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්මේ අඩංගු නොවේ නම්, සැලැස්මට සංශෝධනයක් ලෙස එවැනි ක්‍රියාකාරකම් සැලැස්මක් එකතු කර අනුමත කරගත හැකිය.

## 6.0 මුදල් වෙන්කිරීමේ ප්‍රමුඛතාවය.

ඉහත 2.0 සඳහන් අරමුණු 4 ම ක්‍රියාත්මක හා ආවරණය වන පරිදි මුදල් වෙන්කළ යුතු අතර එම වෙන් කිරීමේ ප්‍රමාණය පාසලේ අවශ්‍යතාවය අනුව ප්‍රමුඛතාගත කරගත හැකිය.

## 7.0 මුදල් භාරගැනීම.

අදාළ අරමුදල් පාසල් සංවර්ධන ගිණුමට බැරවූ වහාම, ඒ බව විදුහල්පති වෙත ලිඛිතව දැනුම් දෙන අතර, එසේ දැනගත් වහාම ඊට අදාළව පාසල් සංවර්ධන සමිති ගිණුමේ ලදුපතක් ද සමග ආවරණ ලිපියක් මගින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත මුදල් භාරගත් බවට දැනුම් දිය යුතුය.( 26/ 2018 චක්‍රලේඛය භාවිත කළ යුතුය.) ( ආකෘතිය 2)

## 8.0 මුදල් වියදම් කිරීම.

මෙම මුදල් වියදම් කිරීමේ දී වැය ලෙජරයේ වෙනම පිටුවක් පවත්වාගෙන යා යුතුය. අදාළ ගිණුම් වාර්තා වෙන වෙනම පවත්වා ගත යුතුය.

## 9.0 ප්‍රදානය සම්බන්ධයෙන් කලාප / පළාත් මට්ටමින් නියාමනය හා වාර්තාකරණය.

මෙම ප්‍රදානය සම්බන්ධ ව වර්ෂයට අදාළ මුදල් වියදම් කිරීමෙන් අනතුරුව විදුහල්පති විසින් දී ඇති අකෘතියට (ආකෘති 3) අනුව සකස් කළ අයවැය වාර්තාවක් පිටපත් 03 කින් යුක්තව කලාප අධ්‍යාපන කාර්යාලයේ සැලසුම් අංශය වෙත භාර දිය යුතුය. ඉන් එක් පිටපතක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය සහිතව පාසලේ අදාළ ව්‍යාපෘති ගොනුවට ඇතුළත් කළ යුතුය.